
The Three Bears by leo Tolstoy
වලස්සු තුන්දෙනා
ලියෝ තෝල්ස්තෝයි

ඔන්න එක පුංචි ගෑනු ළමයෙක් දවසක් කැලේ ඇවිදින්න ගියා. එයා කැලේ අතරමං වුණා. ගෙදර එන්න පාර සොයා ගන්න මහන්සි ගත්තා. ඒත් බැරි වුණා.

කැලේ එහාට මෙහාට ඇවිදින කොට එයාට පුංචි ගෙයක් දකින්න ලැබුණා.

පුංචි ගෑනු ළමයා ඒ ගෙදර දොර ඇරලා ඇතුළට එබිලා බැලුවා. කවුරුවත් පේන්න හිටියේ නැහැ.



එයා ඇතුළට ගියා. ඒ ගෙය වලස්සු තුන්දෙනෙක් ඉන්න ගෙයක්. වලස් තාත්තා ලොකුයි. ලෝම පිරිලා.



වලස් අම්මා තරමක් ලොකුයි. වලස් පැටියා පුංචියි. එයාගේ නම මීෂා. ඒ ගොල්ලො කෑම නිවෙනකන් එළියට ගිහිල්ලා හිටියේ.



මේ පුංචි ගෙදර කාමර දෙකක් තිබුණා. එකක් කෑම කාමරය. අනික නිදන කාමරය.

පුංචි ගෑනු ළමයා කෑම කාමරයට ගියා. මේසය උඩ සුප් කෝප්ප තුනක් තිබුණා. පළමු වන ලොකු කෝප්පේ වලස් තාත්තාගේ... දෙවන කෝප්පේ වලස් අම්මාගේ...



පුංචිම නිල් කෝප්පේ මීෂාගේ... කෝප්පප ළඟ හැඳිත් තියලා තිබුණා. පුංචි ගෑනු ළමයා කෝප්පප තුනේම සුප් රස බැලුවා. මීෂාගේ නිල් පාට කෝප්පේ සුප් ගොඩක් රසයි.

දැන් පුංචි ගෑනු ළමයට හරිම වෙහෙසයි. එයා වට පිට බැලුවා. පුටු තුනක් තිබුණා. ලොකුම පුටුවේ වාඩිවෙන්න හැදුවා. එයා වැටෙන්න ගියා. දෙවන පුටුව ඒ තරම් සුවපහසු නැහැ. තුන්වන පුංචි පුටුව නම් හොඳයි.



ඒක නිල් පාටින් කුෂන් කරලා තිබුණේ. හරිම සැප පහසුයි. එයා සන්තෝසෙන් අත්පුඩියකුත් ගහලා පුටුවේ ඉඳ ගත්තා. නිල් පාට පුංචි කෝප්පේ සුප් එක අරගෙන ටික ටික බිව්වා.



ඊට පස්සේ පුටුවේ ඉස්සරහට පස්සට පැද්දෙන්න පටන් ගත්තා. දන්නෙම නැතිව පුටුව කැඩිලා එයා බිමට වැටුණා!

පුංචි ගෑනු ළමයා නැගිටලා ගියා අනිත් කාමරයට.



ඒ කාමරේ ඇඳන් තුනක් තිබුණා. කාමරේ තිබුණ ලොකුම ඇඳ වලස් තාත්තාගේ. එයා ඒ ඇඳට පැන්නා. ඒ ඇඳ පළල වැඩියි. දෙවන ඇඳ වලස් අම්මාගේ... ඒකටත් පැන්නා...



ඒක උස වැඩියි... අනෙක් පුංචි ඇඳට පැන්නා. ඒක හොඳයි... සැපපහසුයි. පුංචි ගෑනු ළමයාට නින්ද ගියා.



වලස් පවුල ගෙදර ආවා... හරිම බඩගිනියි. ඒ ගොල්ලෝ ඉක්මනට කෑම කාමරයට ගියා.



වලස් තාත්තා සුප් කෝප්පය අතට ගත්තා. ඒක දිහා බලලා කෑ ගහලා ඇහුවා, “කවුද මගේ සුප් එක රස බලලා තියෙන්නේ...” කියලා.

වලස් අම්මත් එයාගේ සුප් කෝප්පය අතට අරගෙන, "මගේ සුප් එකත් කවුරු හරි රස බලලා තියෙනවා..." කියලා කිව්වා.



වලස් පැටියත් එයාගේ හිස් සුප් කෝප්පය අතට අරගෙන දුකෙන් කිව්වා, "අනේ, මගේ සුප් එකත් සේරම බීලා."

වලස් තාත්තා නැවතත් කෑ ගහන්න ගත්තා.



"කවුද මගේ පුටුවේ වාඩිවෙලා... ඒක තිබුණේ මෙතන නෙමෙයි..." වලස් අම්මත් එයාගේ පුටුව දිහා බලලා කිව්වා, "කවුද මගේ පුටුවෙත් වාඩිවෙලා. ඒක තිබුණොත් මෙතන නෙමෙයි."

පුංචි වලස් පැටියා
එයාගේ කැඩුණු පුටුව
පෙන්නලා හෙමින් කිව්වා,
"කවුද ඒක කඩලා...!"



වලස්සු තුන්දෙනා නිදන කාමරයටත් ගියා.



වලස් තාත්තා කෑ ගහලා ඇහුවා, “කවුද මගේ ඇඳට නැගලා ඇඳ අවුල් කරලා දමලා...”

වලස් අම්මත් අහනවා,
"කවුද මගේ ඇඳටත් නැගලා
මගේ ඇඳත් අවුල් කරලා
දාලා..."



වලස් පැටියා එයාගේ ඇඳ ළඟ තිබුණු බංකුවට නැගලා කෑ ගහන්න ගත්තා.

"කවුද මගේ ඇඳේ ඉන්නවා..."



පුංචි ගෑනු ළමයා එයාගේ ඇඳේ නිදාගෙන ඉන්නවා වලස් පැටියා දැක්කා.

“මෙන්න එයා ඉන්නවා... අල්ලගන්න... අල්ලගන්න...”

පුංචි වලස් පැටියගේ කෑ ගැහිල්ලට පුංචි ගෑනු ළමයා ඇහැරුණා. එයා ඇස් ඇරලා බලන කොට වලස්සු තුන්දෙනා දැක්කා.



එයා ඇඳෙන් බිමට බැහැලා ජනේලෙ ඇරගෙන එළියට පැනලා දුවන්න පටන් ගත්තා.



වලස්සු තුන්දෙනාට එයා අල්ලගන්න බැරිවුණා...







# වලස්සු තුන්දෙනා

ලියෝ තෝල්ස්තෝයි

The Three Bears by

LEO TOLSTOY

රුසියන් බසින් ඉංග්‍රීසි බසට පරිවර්තනය

අයිවි ලිප්විනොව්

ඉංග්‍රීසි බසින් සිංහල බසට පරිවර්තනය

සරත් කෝදාගොඩ

නව මුද්‍රණය : 2015

මුද්‍රණය: මධු ප්‍රින්ටින් වර්ක්ස්
71/බී, නව නුවර පාර,
උඩුපිල, දෙල්ගොඩ.
දුර: 0779334211-2

Sarasavi Bookshop
9 5 5 5 9 1 0 6 9
WALASSU THUNDENA
7-2021 Rs. 220.00

මිල රු. 220/=

කුරුළු පොත් ප්‍රකාශකයෝ
594/1, නාවල පාර, රාජගිරිය දුරකථනය : 011-2863350/071-8263828

Cover Design by H. Pradeep Darshana, Ragama. Tel : 0772876280